# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 128 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 24/01/2024<br>පැය 1305 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට – කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.01.12 වන දින පුත්තලම කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මගින් හුණුපිටිය, වත්තල ප්‍රදේශයේ දී අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 02 ග්‍රෑම් 810 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සිදු කල විමර්ශනයේ දි අනාවරණය වු කරුණු මත කොළඹ අපරාධ කොට්ඨාසය විසින් විමර්ශනයක් සිදුකර මෙම මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ ප්‍රධාන සැකකරුවෙකු කොළඹ 13 පිහිටි මහල් නිවාසයක සැඟව සිටින බවට ලද තොරතුරක් මත නිවස පරීක්ෂා කර සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. ඔහු සමඟ සිටි සැකකාරියක්ද කොළඹ අපරාධ කොට්ඨාසය මගින් සැකපිට අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු වයස අවුරුදු 30 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරිය වයස අවුරුදු 22 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකාරියක වේ.

සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - කිලිනොච්චිය පොලිස් වසම.**

2024.01.23 වන දින අළුයම් කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ ඒ 09 මාර්ගයේ උමෙයියාල්පුරම් ප්‍රදේශයේදී යාපනය දෙස සිට වව්නියාව දෙසට ගමන් කල ලංගම බස් රථයක් මර්ගයේ ගමන් කල ගවයින් රැලක් ඉස්සර කිරීමට යාමේ දී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි වෑන් රථයක ගැටී අනතුරක් සිදුව ඇත.

වෑන් රථයේ සිටි මගීන් 06 දෙනෙකු සහ ගොපළු පුද්ගලයා ද අනතුරින් තුවාල ලබා කිලිනොච්චිය රෝහලට ඇතුලත් කිරීමේදී වෑන් රථයේ පැමිණි කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 46 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචිකාරියක් වේ.**

මෘත ශරීරය කිලිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, බරපතල තුවාල ලැබූ ගොපළු පුද්ගලයා වැඩිදුර ප්‍රතිකාර සඳහා යාපනය රෝහලට මාරුකර යවා ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.